# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව</u>

# <u>2021.10.15</u>

පැමිණීම,

පැමිණීමේ ලේඛණය පරිදි වේ.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපති හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2021.10.15 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිතුමන් සහ මැති ඇමතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් පවතින ගැටළු විසඳාගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ප්‍රධානම රාජ්‍ය නිලධාරීන්ගේ රැස්වීම වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දෙමින් සහ එහි උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස සිහි කරමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.

ඒ අනුව, ඉදිරියේදී සෑම මසකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් අතර 2021.07.16 දිනැති රැස්වීම් වාර්තාව සභාසම්මත කිරීමට අවස්ථාව ලබා දුනි. අඩුපාඩු කිසිවක් වාර්තා නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර, අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **කොවිඩ් - 19 වසංගත තත්ත්වය පිටු දැකීමට අදාල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 1.1 | කොවිඩ් - 19 වසංගත තත්ත්වය පිටු දැකීමට අදාල වර්තමාන තත්ත්වය ඉදිරිපත් කිරීම | සියළුදෙනාගේ සහයෝගය තුළ මෙම වසංගත තත්ත්වය සාර්ථකව පාලනය කරගැනීමට හැකියාවක් ලැබී ඇති බවත් දිනකට 50 කට වඩා අඩු රෝගීන් සංඛ්‍යාවක් හඳුනාගැනීමක් සිදුවන බවත් මේ වන විට ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව ගර්භණී මාතාවන් 5ක් ද ඇතුළුව 641ක් නිවෙස් නිරෝධායනයේ, අතරමැදි ප්‍රතිකාර ඒකකයන්වල හා ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබන බවත් PCR සාම්පල් 91574 ක් දැනට සිදුකර ඇති අතර දිනකට PCR සාම්පල් 275 හා රැපිඩ් ඇන්ටිජන් ටෙස්ට් 20-25 සිදු කරන බවත් පසුගිය පැය 24 තුළ රෝගීන් 23 ක් වාර්තා වී ඇති බවටත් තංගල්ල, හම්බන්තොට හා අම්බලන්තොට වැඩි අවධානම් කළාප ලෙස හඳුනාගෙන ඇති බවත් හම්බන්තොට දිස්තික්කයේ 148 දෙනෙකු මරණයට පත්වී ඇති අතර ඔවුන් වැඩි දෙනෙක් වයස අවුරුදු 60 ඉක්මවූ පිරිස බවටත් කරුණු ඉදිරිපත් | මෙම වසංගත තත්ත්වය සාර්ථක පාලනය කර ගැනීම සඳහා අදාල සියළුම පාර්ශවයන්ගේ සහාය ඉදිරියටත් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කරන ලදි.<br>මේ වන විට ලැබී ඇති එන්නත් මාත්‍රා අවුරුදු 60 ට වැඩි අය සඳහා ලබා දී අවසන් බවත් අධි අවධානම් කණ්ඩායම් හඳුනාගනිමින් උපරිම සාධාරණව සාර්ථකව ලබාදී අවසන් වෙමින් පවතින බවට ද පාසල් ළමුන් සඳහා 2021.10.21 දින සිට එන්නත් ලබාදීම ආරම්භ කරන බවට හා නැවත රෝගී කණ්ඩායම් ආරම්භ වීමේ අවධානම හේතුවෙන් ඉලක්ක කණ්ඩායම් හඳුනා ගනිමින් දැනුවත් කිරීම් සිදු කරන බවට ද වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන ලදි. | | |
| 1.2 | නව රෝහල් භූමියේ ඇතුල්වීමේ දොරටු සකස් කිරීම | රෝහලේ පවතින ඇතුල්වීමේ දොරටුව සම්පූර්ණයෙන් වසා නව ඇතුල්වීමේ දොරටුවක් සෑදීමේදී පවතින රෝහල් සැලසුමත් සමඟ ගැටළුකාරී තත්ත්වයක් මතුවන බවත් ඇතුල්වීමේ දොරටු 02 කම භාවිතයට සකස් කිරීම වඩා සුදුසු බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | රෝහලේ ඇතුල්වීමේ දොරටු දෙකම භාවිතයට ගතහැකි අයුරින් සකස් කිරීමට තීරණය විය | රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.3 | අඟුණකොළපැලැස්ස රෝහල් භූමිය අනවසරයෙන් පුද්ගලයන් විසින් අල්ලා ගැනීම සිදුවීම | මේ සම්බන්ධයෙන් අනවසර පදිංචිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති නඩුව මේ වන විට ඉවත්කරගෙන ඇති බවත් භූමියේ ආරක්ෂිත වැටක් ඉදිකල හැකි බවටත් තොරතුරු වාර්තා වූ අතර රෝහල් භූමිය ආවරණය කර වැටක් ගැසීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | ඉඩම් මිල ඉහල යාම නිසා අනවසර අල්ලා ගැනීම් සිදු වන බවත් ඊට ඉඩ නොතබා රෝහල් භූමිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බවට තීරණය විය. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - හම්බන්තොට<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| **02** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | වාරි සෞභාග්‍යා වැඩසටහන | වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වැව් 49 න් 40 ක වැඩ ආරම්භ කර ඇති අතර ඉන් වැව් 10 ක සංවර්ධන කටයුතු අවසන්ව පවතින බවත් මේ වන විට රු.මි. 120 ක් ආයතනය වෙත ලැබී ඇති බවත් එසේම, අලුතින් යෝජනාවී ඇති වැව් 6 ක් ( රත්මල්ගහවැව, යාල සල්මල් පැලැස්ස, නිමලව ආරණ්‍ය අසල වැව, දුම්බර වැව, ජම්බුගස්ආර වැව සහ සිතුල්පවුව වැව රලපනාව ) ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන බවත් දැනුම් දෙන ලදි.<br>තවද, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වැව් 6 ක ප්‍රතිසංස්කරණ කටයුතු වලින් වැව් 2 ක් | පන්නෙගමුව වැව හා යෝධවැව ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යාවශ්‍ය බවත් අදාල ව්‍යාපෘති කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් ලබාදුන් අතර ඉදිරිපත් කරන ලද වැව් නාම ලේඛනය සඳහා අනුමැතිය ලබා දෙන ලදි.<br>එසේම මෙම ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමේදී පුරාවිද්‍යා නිර්දේශයන් ලබාගන්නා ලෙස ද දැනුවත් කරන | වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු,<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අවසන් කර ඇති බවත් 4 ක් අවසන් අදියරේද,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වැව් 12 න් 10ක වැඩ අවසන් කර ඇති බවත් 2 ක වැඩ අවසන් වෙමින් පවතින බවට වාර්තා විය.<br><br>අඟුණකොළපැලැස්ස එරමිණියාය වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ජලසම්පාදන මණ්ඩලය වෙත රු.මි. 12.7 ක ඇස්තමේන්තුවක් ලැබී ඇති බවත් එය මහවැලි අධිකාරිය මඟින් සිදු කර ගැනීමට අනුමැතිය ලැබී ඇති බවත් මේ වන විට අවබෝධතා ගිවිසුම මහවැලි අධිකාරිය වෙත ලබා දී ඇති අතර අනතුරුව වැඩ ආරම්භ කිරීමට නියමිත බවට කරුණු ඉදිරිපත් විය. | ලදි.<br><br>ආයතන දෙක එකතුවී ව්‍යාපෘති කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය කළමණාකරු, ජලසම්පාදන මණ්ඩලය<br><br>නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. |
| 2.2 | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | වැව් 17 ක වැඩ කරමින් පවතින බවත් තවත් වැව් 5ක් ආරම්භ කිරීමට නියමිත අතර එම වැව් 22 මේ වසර අවසන් කිරීමට නියමිත බවට කරුණු ඉදිරිපත් විය.<br><br>තවද, ඇත්බටුව වැව ප්‍රතිසංස්කරණය පිළිබඳව මෙහිදී සාකච්ඡාවූ අතර එය පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සිදුකල බවට වාර්තාවූ අතර වැව් ප්‍රතිසංස්කරණයේදී වඩාත් ඵලදායීව ඒවා සිදුකල යුතු බවට අදහස් ඉදිරිපත් කරන ලදී. | පවතින ගැටළු විසඳා ගනිමින් අදාල ව්‍යාපෘති කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි.<br><br>පළාත් සහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු සමග එම යෝජනා පිළිබඳව මනා සම්බන්ධතාවයක් තබා ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ- දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු,<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 2.3 | රන්මිහිතැන්න ඒකාබද්ධ කෘෂි සංවර්ධන ව්‍යාපෘතිය | මෙමෙ ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සඳහා ජලය ලබා ගැනීමේ ගැටළු පවතින බවත් එතෙක් පාරම්පරිකව හේන් වගාවේ නිරතවූ අය සඳහා හේන් ගොවිතැන් කටයුතු සිදු කිරීමට අවසර ලබා දෙන ලෙසත් දැනුම් දෙන ලදි. පසුගිය වසරේ හේන් වගාව සම්බන්ධව චක්‍රෙල්ඛයක් නිකුත්වූ බවත් ඒ අනුව, මාස 06 ක් සඳහා බලපත්‍ර ලබාදිය හැකි බවත් ප්‍රකාශ වූ අතර හේන් වගාවට මුවා වී මහා පරිමාණව ඉඩම් අල්ලා ගැනීම්, දැව ජාවාරම් සිදුවීම් සිදුවන බවටද කරුණු ඉදිරිපත් විය. | පරිසරය ආරක්ෂා කිරීමට මුල් තැන දෙමින් අදාල ආයතන එකතුවී සුදුසු අය හඳුනා ගනිමින් හේන් ගොවිතැන් කිරීම සඳහා ක්‍රමවත්ව අවසර දීමට කටයුතු කලයුතු බවට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්,<br><br>දිසා වන නිලධාරි<br><br>සහකාර අධ්‍යක්ෂ, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන් තුව<br><br>දිසා වන නිලධාරී |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තිස්සමහාරාම ඉඩම් බැහැර කිරීම පිළිබඳව ගැටළුකාරී තත්තවයක් පවතින බවත් රජයට ලැබිය යුතු බදු ප්‍රතිශතය ප්‍රමානවත් නොවන බවත් පැහැදිළි කරන ලදි.<br><br>තිස්සමහාරාම කඩවර වනසංරක්ෂණයට අයත් අක්කර 4700 හේන් වගාවට නිදහස් කර ඇති බවත් මෙම ප්‍රදේශයට අයත් කොටසකට 2014 වර්ෂයේ බලපත්‍ර 4 ක් අක්කර 9 1/2 ක් ආවරණය වන පරිදි ලබා දී ඇති බවටත් එහෙත් අක්කර 25 - 30 ක ප්‍රමාණයක් වගා කරන බවට කරුණු ඉදිරිපත් විය. | තිස්සමහාරාම ඉඩම් බැහැර කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් මේ සම්බන්ධව වෙනම සාකච්ඡාවක් පැවැත්විය යුතු බවට දැනුම් දෙන ලදි.<br><br>මෙම ඉඩම් භාවිතය පිළිබඳව හා එකී ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාම |
| 2.4 | විමධ්‍යගත අයවැය වැඩසටහන | මේ වන විට යෝජනා ක්‍රියාත්මක වෙමින් පවතින බවත් තවදුරටත් සංශෝධනය වෙමින් පවතින අතර දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාල මහින් ව්‍යාපෘති 948 ක් ක්‍රියාත්මක වන බවත් සංශෝධනය වන 15–20 අතර ව්‍යාපෘති යෝජනා සඳහා ඉදිරියේදී කඩිනමින් අනුමැතිය ලබාදීම් සිදුවන බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | අදාල පාර්ශවයන් සම්බන්ධවී කඩිනමින් කාර්යයන් නිම කිරීමට තීරණය විය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 2.5 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන | සියළුම ව්‍යාපෘති ආරම්භ කර සාර්ථකව සිදුකරන බව හා වලස්මුල්ල, හම්බන්තොට, බෙලිඅත්ත, වීරකැටිය, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ප්‍රගතිය ප්‍රමාණවත් නොවන බවටත් දන්වා සිටින ලදි. | මෙම ව්‍යාපෘතිවල ඵලදායීතාව ඉහල නංවා ගැනීමටත් කඩිනම් කිරීමටත් උපදෙස් ලබාදුනි. | අදාල ප්‍රාදේශීය සභාවල ගරු සභාපතිවරුන්, අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.6 | “සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන” වැඩසටහන | දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකම ක්‍රියාත්මක මෙම නිෂ්පාදන වැඩසටහන යටතේ ගම්මාන 28 ක් ක්‍රියාත්මක වන අතර ප්‍රතිලාභීන් 1252 කි. එහිදී ප්‍රතිලාභී දායකත්වය රු.මි.101 ක්, රජයේ දායකත්වය රු.මි. 91.72 කි.<br>මෙම ගම්මාන සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් යෝජනා 70 ක් සඳහා එක් ව්‍යාපෘතියකට රු.මි. 3 ක් වශයෙන් රු.මි. 84 ක් මේ වන විට අනුමත වී ඇති බවට ද තොරතුරු ඉදිරිපත් විය. ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු දැනුවත් වීම පිළිබඳව සාකච්ඡා වූ අතර දින දෙකක කාලයක් තුළ කඩිනමින් යෝජනා ඉදිරිපත් කර ප්‍රතිපාදන අනුමත කරගත් බවත් සංශෝධන අවශ්‍ය නම් | සියළු පාර්ශවයන්ගේ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කර මෙම ව්‍යාපෘතිවල ඵලදායීතාව ඉහල නංවා ගන්නා ලෙස උපදෙස් ලබාදුන් අතර සංශෝධන තිබේනම් සතියක් ඇතුළත ලබා දෙන ලෙස දන්වන ලදී. | දිස්ත්‍රික් ලේකම්,<br><br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සතියක් ඇතුළත ලබා දෙන ලෙසත් දන්වන ලදී. | | |
| 2.7 | 2021 වර්ෂයේ ඉදිකිරීමට යෝජිත විදුලි වැට මාර්ග ශුද්ධ කිරීමේ ව්‍යාපෘතිය | තිස්සමහරාම, හම්බන්තොට, සූරියවැව හා ලුණුගම්වෙහෙර යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 4ක ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇත.<br>මෙම ප්‍රතිපාදන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාල මාර්ග ශුද්ධ කිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර වැට මායිම් නිරවුල් කර ගැනීමේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘති 11න් 3ක පමණක් වැඩ කටයුතු අවසන් වූ බවත් අලිවැට ඉදිකිරීමේ කටයුතු ගුවන් හමුදාව මගින් සිදු කිරීමට නියමිත බවත් රට තුළ පවතින කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ වනජීවී දෙපාර්තමේන්තුව මඟින් යෝජිත විදුලි වැට ඉදි කිරීමට අවශ්‍ය උපකරණ සැපයීම ප්‍රමාදවීම තුළ මෙම ඉදිකිරීම් කටයුතු තවදුරටත් ප්‍රමාදවී ඇති බව දැනුම් දෙන ලදි.<br><br>තවද මේ වන විට වන අලි ගැවසෙන වරාය භූමිය ශුද්ධ කිරීමේදී ක්‍රමානුකූලව ශුද්ධ නොවීම තුළ වන අලි ආසන්න ගම්මාන වලට වැදී හානි කිරීම් සිදු වන බවත් මෙම තත්ත්වය පාලනය කිරීමට කඩිනමින් විදුලි වැට ඉදිකිරීම සිදුකළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. | අදාල අයතන සහ ගම්වාසීන් අතර එකඟතාවයක් ඇතිකරගෙන සුදුසු පරිදි කඩිනමින් වැට මායිම් නිරවුල් කර ගැනීමේ කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>මෙම තත්ත්වය විසඳා ගැනීම සඳහා යෝජනා කරන විසඳුම් ඇතුලත් වාර්තාවක් කඩිනමින් ලබා දෙන ලෙස දන්වන ලදී | දිස්ත්‍රික් ලේකම්<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරු<br><br>අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br><br>සහකාර අධ්‍යක්ෂ (වනජීවී) - වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 2.8 | තෘණ භූමි සංවර්ධනය | දිස්ත්‍රික්කයේ තෘණ භූමි 05 ක් යෝජනාවී ඇති අතර මහවැලි බල ප්‍රදේශයේ පිහිට වල්සපුගල තෘණ භූමියේ ගැටළුවක් නොමැති බවත් අනෙකුත් 04 ම වන සංරක්ෂණ ප්‍රදේශ වල පිහිටා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව හා මේ වන විටත් ඒ සඳහා නිරවුල් කිරීමක් කර ප්‍රදේශය වෙන් කර දීමක් සිදු නොවූ බවට දන්වා සිටින ලදි. | දිස්ත්‍රික්කයේ ගව පාලනය සම්බන්ධයෙන් ගැටළු බොහෝමයක් ඇතිවී තිබෙන හෙයින් දිස්ත්‍රික්කයේ තෘණ භූමි සංවර්ධනය කලයුතු බවට තීරණය වූ අතර මේ සම්බන්ධව වන සංරක්ෂණ අධ්‍යක්ෂ දැනුවත් කිරීමට තීරණය කරන ලදි . | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහරාමය/ ලුණුගම්වෙහෙර<br><br>නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය/<br><br>දිසා වන නිලධාරි සහකාර අධ්‍යක්ෂ වන ජීවී දකුණ - නියෝජ්‍ය අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | | | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, |
| 2.9 | "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන | ව්‍යාපෘති 03ක් අනුමත වී ඇති අතර ඉන් දෙකක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන අතර අම්බලන්තොට වලවේ ගඟ ව්‍යාපෘතිය යටතේ ගඟ රක්ෂිතයේ ඇති නිවාස සඳහා තාවකාලික සීල් කරන ලද වැසිකිලි පහසුකම් ලබාදීම අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබන බව දැනුම් දෙන ලදී.<br>ලුණුගම්වෙහෙර වැවේ සොරොව්වේ සිට ඇල්ලගල අමුණ දක්වා ගඟ පිරිසිදු කිරීම සිදුකරන අතර 2021.10.16 දින වැඩ ආරම්භ කිරීමට නියමිත බව දැනුම් දෙන ලදී. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කටයුතු සිදුකරන ලෙස දන්වන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ - වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට<br>සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය, |
| 2.10 | කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන | වී වගාවේ ඉලක්කය හෙක්ටයාර් 39634.26 ක් වන අතර කොම්පෝස්ට් කි.ගෑ.500 ක් හෙක්ටයාර් එකකට යෙදිය යුත වේ. ඒ අනුව, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 19812.38 ක අවශ්‍යතාවයක් දිස්ත්‍රික්කය තුළ පවතී.<br>මෙම අවශ්‍යතාවයෙන් මෙට්‍රික් ටොන් 12,146.40 ක ප්‍රමාණයක් ගොවිජන සේවා, පළාත් පාලන ආයතන හා ස්වයං නිෂ්පාදකයින් හරහා ලබා ගැනීමට හැකියාව පවතින බවත් ඉතිරි ප්‍රමාණය සපයා ගැනීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.<br>දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කාබනික පොහොර දිරිගැන්වීම සඳහා පළාත් සභාවේ සියළුම පළාත් පාලන ආයතන වෙනුවෙන් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සඳහා රු.මි.100 බැගින් වෙන් කර ඇති බවත් දන්වන ලදී.<br>එසේම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් ස්වයංව කාබනික පොහොර නිපදවා ගන්නා ගොවීන් වෙනුවෙන් රු.12500.00ක් ලබා දෙන බවත් මෙය අධියර 2 ක් යටතේ රු.7500.00 ක් රු.5000.00 ක් ලෙස ලබා දෙන බවත් දන්වන ලදී.<br>තවද, සුහුරු ව්‍යාපෘති බලප්‍රෙද්ශයේ කාබනික පොහොර නිපදවන ගොවීන් | කෙසේ වෙතත් ඉදිරිපත් වන සංඛ්‍යා ලේඛන වලින් පෙන්වන වාර්තා සත්‍ය තත්ත්වයට නොගැලපෙන බව පෙනී යන බවත් ලබා දෙන කාබනික පොහොර වගාවන්ට ගැලපේද සොයා බැලීමට කටයුතු කල යුතු බවත් නිසි පරිදි දිස්ත්‍රික්කයේ ගොවියන්ට බෙදාහැරීම් කටයුතු කලයුතු බවත් දන්වන ලදී. | ප්‍රාදේශීය සභා ගරු සභාපති වරුන්<br>දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br>කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නි.අධ්‍යක්ෂවරු<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්<br>සහකාර අධ්‍යක්ෂ (පොහොර) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් ඔවුන්ගේ ප්‍රතිපාදන යටතේ රු.13500.00 ක් ලබා දෙන බවත් දන්වන ලදි.<br><br>එමෙන්ම, එළවළු හා පලතුරු නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොහොර ලබාගැනීම පිළිබඳව හා වල් නාශක ලබා ගැනීම සහ දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර වැඩි මිලට වෙනත් දිස්ත්‍රික්කවලට අළෙවි වීම වැනි ගැටළුකාරි තත්ත්වයන් පැවතිම සම්බන්ධව වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය.<br>තවද, ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් කාබනික පෙහොර අළෙවි කිරීමට කටයුතු කරන අතර මේ මස 25 වන දින සිට දියර පොහොර හෙක්ටයාර් 1 ට ලීටර් 2 1/2 ක් පොටෑසියම් කිලෝ 40ක් හා නයිට්‍රජන් නොමිලේ ලබා දීමට කටයුතු කරන බව හා වල් නාශක රජයෙන් ලබා දීමට කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| 2.11 | මැණික් ගඟ සංවර්ධන ව්‍යාපෘතිය (රු.මි. 23) | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂය සඳහා රු.මි.23ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇති බවත් භෞතික ප්‍රගතිය 21%ක් වන බවත් දැනට රු.මි.14ක වියදමක් දරා ඇති බවත් ගැටළුවකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත් දැනුම් දෙන ලදී. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ |
| 2.12 | ඵලදායී ප්‍රවර්ධන කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) – (රු.මි. 17) | ව්‍යාපෘති කටයුතු සිදු කරමින් පවතින බවත් විශේෂ ගැටළුවක් නොමැති බවටත් වාර්තා විය. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ |
| 2.13 | මීටර් 260 ක් දිග රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම (දෙවන අදියර) - මැඳකැටිය , මැඩිල්ල (රු.මි. 15) | ව්‍යාපෘති කටයුතු සිදු කරමින් පවතින බවට හා අදාල කාලය තුළ වැඩ නිම කල හැකි බව ද දන්වන ලදි. | වර්ෂය තුළ අපේක්ෂා කල ඉලක්ක සම්පූර්ණ කලයුතු බැවින් ඒ අනුව කටයුතු කලයුතු බව දැනුම් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වෙරළ පාරිසරික මධ්‍යස්ථානය |
| 2.14 | මාර්ග කි.මී. 100,000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (රු.මි. 25579.16) | මාර්ග කි.මී. 1075 ක කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති ඒවායේ කටයුතු බාධාවකින් තොරව සිදුවන බව දන්වන ලදි. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.15 | මාර්ග හා පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම (රු.මි. 151.98) | 14 ක් වැඩ ආරම්භ කර ඇති බවත් පාලම් 18 ක් නගමු පුරවර වැඩසටහන යටතේ සිදු කිරීමට නියමිත අතර ප්‍රතිපාදන ලැබීමේ පමාදවීම හේතුවෙන් කල්ගතවීමක් සිදුවීමේ හැකියාව පවතින බවට කරුණු ඉදිරිපත් කරන ලදි.<br><br>කටුවන ප්‍රාදේශිය සභාවේ දෙහිගහහේනෙන් ආරම්භ වී රම්මල කර්මාන්තශාලාව දක්වා මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකුම වැඩ ආරම්භ කලද මේ වන විට වැඩ නතරකර ඇති බව බවට දැනුම් දෙන ලදි.<br><br>අලුත්ගල පාර සංවර්ධන ව්‍යාපෘතියෙන් කොන්ත්‍රාත්කරු කැමැත්තෙන් ඉවත් වීමට ලිපි ඉදිරිපත්කර ඇති අතර 2021.12.31 දක්වා කල් ඉල්ලා ඇති බව දන්වා සිටින ලදි.<br><br>පාලම් පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කටයුතු සිදු කරමින් පවතින බවට දන්වන ලදි. | මේ සම්බන්ධව සතියක් ඇතුලත කරුණු වාර්තා කිරීමට තීරණය විය.<br><br>ලබා දී ඇති කොන්ත්‍රාත් කරුගෙන් ඉවත් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙතට ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 2.16 | ලෝක බැංකු ආධාර යටතේ ගබඩා පහසුකම් වැඩිකිරීම (රු.මි. 33.1) | මයුරපුර, වීරවිල, රිදියගම, අතිරේක ආහාර භෝග සඳහා ගබඩා 03ක් ද ඉදිකිරීමට මිල ගණන් කැඳවා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | නියමිත ක්‍රමවේද අනුගමනය කර ව්‍යාපෘතිය කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | අධ්‍යක්ෂ (කෘෂිකර්ම)/ සහකාර අධ්‍යක්ෂ, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය/ (NLDB) |
| 2.17 | සියක් නගර වැඩසටහන (රු.මි. 9789) | මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 06ක් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කළ සැලසුම් මාර්ග සංවර්ධන අධිකාරිය සමග ගැලපීමේ දී මතු වූ ගැටළු මත නෝනගම හා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලුත්වැව යන ව්‍යාපෘති 2 සඳහා මිනින්දෝරු සැලසුම් ඉල්ලා සිටි බැවින් එම කටයුතු සිදු කරන බවත් රන්න, විත්‍රාගල, වීරවිල සහ ලුණුගම්වෙහෙර කොට්ඨාසයේ මුල්ගල හංදිය යන ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරි සීමාවෙන් බැහැරව බාධාවකින් තොරව සිදු කරමින් පවතී.<br>මෙම ව්‍යාපෘති 06හිම පවතින විදුලි කණු | පවතින ගැටළු විසදා ගනිමින් ව්‍යාපෘති කටයුතු කඩිනම් කරන ලෙසත් හා විදුලි කණු විතැන් කිරීම මුදල් අයකිරීමකින් තොරව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - ලංකා විදුලිබල මණ්ඩලය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | විදුලිබල මණ්ඩලයේ වැය ශීර්ෂය යටතේ මාර්ගයේ පදික වේදිකාවෙන් පිටතට කඩිනමින් ඉවත් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. | | |
| 2.18 | හම්බන්තොට බැංකු කළාප ව්‍යාපෘතිය (රු.මි. 680) | විදුලි කණු මාර්ගයෙන් ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා දී ඇති බවත් එය ගෙවීම් කිරීමට කටයුතු කරන බවත් දන්වන ලදී.මෙම කාර්යය කඩිනම් කර ගැනීමේ අවශ්‍යතාවය නිසා මුදල් ගෙවන තෙක් එම කාර්යය ඉටු කරන ලෙසද ඒ සඳහා ලිඛිත එකඟතාවයක් ලබා දිය හැකි බව ද දන්වන ලදී. | ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස උපදෙස් දෙන ලද අතර ඒ සඳහා විදුලි බල මණ්ඩලයේ එකඟතාවය ලබා දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය |
| 2.19 | හම්බන්තොට නව රෝහල් චතුරස්‍ර ව්‍යාපෘතිය (රු.මි. 700) | ව්‍යාපෘති කටයුතු සිදුකරගෙන යන බවත් පවතින ගැටළු සාකච්ඡාකර විසදාගැනීමට හැකියාව පවතින බවට කරුණු ඉදිරිපත් කරන ලදි.<br>තවද, රෝහල ඉදිරිපිට අනවසර අක්‍රමවත්ව තාවකාලික වෙළඳසැල් පැවතීම එම පරිශ්‍රයේ අලංකරණයට බාධාවක් වන බැවින් ඒවා ඉවත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදි. | අදාළ ආයතන ප්‍රධානීන් සාකච්ඡා කර එය විසඳා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. අනවසර කඩකාමර ඉවත් කිරීමට පෙර කඩහිමියන්ගෙන් මුලික තැන්පතුවක් ලබා ගැනීමෙන් පසු ඉදිකිරීම් සිදු කරන ලෙසත් එම ස්ථිර වෙළඳසැල් සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව අනවසර ඉවත් කිරීම් ඉවත් කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදි. | ගරු නගරාධිපති - හම්බන්තොට මහ නගර සභාව<br>රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 2.20 | බරවකුඹුක උප බස් නැවතුම්පොළ (රු.මි. 41.70) | නොවැම්බර් මස අවසන් කිරීමට හැකියාව පවතින බවට දැනුම් දෙන ලදි. | ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 2.21 | අංපිටිය වැව වටා ඇවිදින මංතීරුව ඉදිකිරීම (රු.මි. 99.32) | ව්‍යාපෘති කටයුතු සාර්ථකව සිදුවන බවත් අදාල කාලය තුළ නිම කිරීමට හැකි බවට කරුණු ඉදිරිපත් විය. | අදාල කාලයන් තුළ ඉලක්ක සම්පුර්ණ කර ගත හැකි පරිදි කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 2.22 | වලස්මුල්ල තොග වෙළඳ සංකීර්ණය ඉදිකිරීම (රු.මි.62.79) | මෙම වර්ෂයේ අවසන් කිරීමට හැකියාව පවතින බවට දැනුම් දෙන ලදි. | | |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 03 | **පසුගිය රැස්වීමේදී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය සාකච්ඡා කිරීම** | | | |
| 3.1 | කුඹුරු හා ගොඩ ඉඩම්වල වැලි කැපීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | පසුගිය වසර 05 තුළ බැංකු ඇපකර හා ගොඩ වැලි කැණීම් බලපත්‍ර වාර්තාව ඉදිරිපත් කර ඇති අතර පුනරුත්තාපනය කර ඇති ඉඩම් අදාල බැංකු ඇපකර නිදහස් කිරීම් කර ඇති බව සහ බලපත්‍ර කාලසීමාව තුළ ඉඩම්වල අදාල පරිදි ගොඩ කිරීම් අධීක්ෂණය කරන බවට කරුණු ඉදිරිපත් විය. | ඒ අනුව අදාල කටයුතු විධිමත් පරිදි ඉටු කරන ලෙස දැනුම් දෙන ලදී. | සියළුම ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරු<br>වාරිමාර්ග අධ්‍යක්ෂ,<br>කැණීම් ඉංජිනේරු-භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |
| 3.2 | රොඩීමැල්ල බස්නාව අවහිර වීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | සියළු පාර්ශවයන් එක්වී ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර ඇති බවත් බස්නාවේ ජලය බැසයාමේදී ඇල මාර්ගයේ පහළ කෙලවරේ ගඟට ආසන්න කොටසේ පවතින අවහිරතාව මෙන්ම අනවසර ඉදිකිරීම් ද බලපාන බවට කරුණු ඉදිරිපත් විය.<br>තවද, අම්බලන්තොට වී පර්යේෂණායතනය සඳහාද අහිතකර ලෙස දැඩිසේ බලපාන බවට කරුණු අනාවරණය කරන ලදි.<br>මෙම ඇලේ පහල කෙළවරේ අමුණක් ඉදිකිරීමට 2022 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරන බවට දන්වා ඇත.<br>එසේම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බෝක්කුව ලොකු කල යුතු බවත් ඇල ශුද්ධ කිරීමත් මෙම අනවසර ඉදිකිරීම් නතර කිරීම සඳහා තාප්පයක් ඉදිකිරීමත් සිදු කිරීම සුදුසු බවට යෝජනා විය. | අදාල සියළුම පාර්ශව එකතුවී මේ පිළිබඳව විධිමත් සැලැස්මක් සකස් කර කටයුතු කරන ලෙස දන්වන ලදී. | ප්‍රාදේශීය ලේකම්-හම්බන්තොට, අම්බලන්තොට<br>අධ්‍යක්ෂ - වාරිමාර්ග<br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය,<br>සහකාර අධ්‍යක්ෂ, වී පර්යේෂණ ආයතනය, අම්බලන්තොට |
| 3.3 | බෙලිඅත්ත වාඩිය අක්කර 20 ක පොල්ඉඩමේ වැලි කැපීම | ඒකාබද්ධ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර හානි සිදුවී ඇත්නම් මාර්ගය සකස් කර දීමට කැමැත්ත පලකර ඇති බවත් දන්වා ඇති බව වාර්තා වූ අතර ප්‍රාදේශීය සභාව සමග ගිවිසුමකට එළඹිය යුතු බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සභාවද සම්බන්ධ කරගෙන කඩිනමින් අදාල ගැටවව විසඳා ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. | ගරු සභාපති - ප්‍රාදේශීය සභාව, බෙලිඅත්ත<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි<br>ප්‍රාදේශීය ලේකම්-බෙලිඅත්ත<br>කැණීම් ඉංජිනේරු-භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.4 | කටුවන ෆයිනස් වගාව ඉවත් කිරීම | මෙම වර්ෂයේදී හෙක්ටයාර් 06 ක් පමණ ෆයිනස් වගාව ඉවත් කරන බවත් ඉතිරි ප්‍රමාණය ඉදිරි වර්ෂයේ ඉවත් කරන බවටත් වාර්තා කර ඇත.<br><br>මෙම වර්ෂයේදී හෙක්ටයාර් 06 ක පමණ වගාව ඉවත් කිරීමට සැලසුම් කල බවත් කපන ලද දැව ප්‍රවාහනය කිරීමේදී කටුවන ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීමේදී ඇප තැන්පත් කල යුතු බවට යෝජනා කිරීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවන බවත් දැනුම් දෙන ලදි.<br><br>රජයේ ප්‍රතිපාදන මගින් ඉදිකර ඇති මාර්ග දැව සංස්ථාව පරිහරණය කිරීමේදී හානි වීම් වන බවත් ඔවුන් ඒවා නිසි පරිදි නැවත සකස් නොකිරීම හේතුවෙන් ඒවා නඩත්තු කිරීමට සභාවට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | කපා ඉවත් කරන දැව ප්‍රවාහනය හේතුවෙන් මාර්ගවලට සිදුවන හානිය පූර්ණ කිරීමේ වගකීම බාර ගන්නා බවට ප්‍රාදේශිය සභාවට ලිඛිතව දැනුම් දී කඩිනමින් මෙම ෆයිනස් වගාව ඉවත් කරන ලෙසත් ඉන්පසු ඉඩම ශුද්ධකර මිනිසුන්ට මෙන්ම සතුන්ටද ප්‍රයෝජනවත් වන කොස්, දෙල් වැනි ශාඛ හා පලතුරු වගා කරන ලෙසත් මෙහි ප්‍රගතිය කඩිනමින් ඉදිරිපත් කරන ලෙසටත් උපදෙස් දෙන ලදි. | ගරු සභාපති, කටුවන ප්‍රාදේශිය සභාව<br><br>දිසා වන නිලධාරි<br><br>ප්‍රාදේශිය කළමනාකරු,<br><br>රාජ්‍ය දැව සංස්ථාව |
| 3.5 | රක්ෂිත ඉඩම්වලට ව්‍යාජ පිඹුරු පත් හා නොතාරිස් ඔප්පු සකස් කර ඉඩම් ජාවාරම් සිදු කිරීම | මේ සම්බන්ධව සිදුකරන පරීක්ෂණ වල ප්‍රගතිය ඉදිරිපත් කරන ලද අතර විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශණයක් මේ වන විට සිදු කරන බවට දැනුම් දෙන ලදි. | අදාල නිවැරැදි තොරතුරු ලබාගෙන විමර්ශන කටයුතු කඩිනම් කර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශිය ලේකම්-හම්බන්තොට,<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි-තංගල්ල,<br><br>ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි |
| 3.6 | අම්බලන්තොට වී අලෙවි මණ්ඩල නිවාසයන්හි පදිංචිකරුවන් සඳහා ඉඩම්වල අයිතිය තහවුරු කිරීම | නව අනවසර පදිංචිකරුවන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකර ඇති අතර භූමිය හා රිදියගම මාර්ගය සලකුණු කරගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කල යුතු බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>ප්‍රාදේශිය ලේකම්-අම්බලන්තොට<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>මිනින්දෝරු දෙපාර්තමේන්තුව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.7 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර ඇති බහුකාර්ය සංවර්ධන සාධක බලකායේ ශ්‍රමලාභීන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේම රාජ්‍ය ආයතනවලට අන්තර්ග්‍රහනය කිරීම | පවතින ක්‍රමවේදයේ වෙනසක් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය අවශ්‍ය බව දැනුම් දී ඇත.<br><br>මාස දෙකක් වැටුප් ලබා නොදීම හේතුවෙන් එම වැටුප් ලබා දීමට සුදුසු පියවර ගන්නා ලෙස ඉල්ලීම. | නයිටා ආයතනනය මඟින් අදාල කාලය තුළ පුහුණුවීම් ලබාදීමට සුදුසු බව දැනුම් දෙන ලදි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>සහකාර අධ්‍යක්ෂ, බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 3.8 | කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ගොඩනැගිල්ලක කඩිනම් අවශ්‍යතාවය | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 05 ක් ඇති අතර ඒවා මෙම අවශ්‍යතාවයට ලබා ගැනීමට හැකියාවක් පවතින බව දැනුම් දෙන ලදි.<br><br>ඉන් කොටසක් මහ රෝහලට අයත් බවද ඒවා දැනට ප්‍රයෝජනයට නොගන්නා බවත් එකී ස්ථාන ලබා දීම සුදුසු බවත් යෝජනා විය. | අදාල ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට/<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 04 | වාරිමාර්ග ක්ෂේත්‍රය | | | |
| 4.1 | කටගමුව වැව පිළිසකර කර අදාළ කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් වල ගොවි නිෂ්පාදන කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස කටගමුව නන්දිමිත්‍ර ගොවි සංවිධාන නිලධාරීන් විසින් ඉල්ලීම | කටගමුව වැව දැනට ප්‍රතිසංස්කරණය වෙමින් පවතින අතර වනජීවි පරිසර සංවේදී ප්‍රදේශයක් වන කටගමුව අභයභූමිය තුළ මෙම කුඹුරු ඉඩම් පිහිටා ඇති බව ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ දී සාකච්ඡා වූ බවට දැනුම් දෙන ලදී.<br><br>මෙම කුඹුරු ඉඩම්වල පාරම්පරිකව ගොවිතැන් කටයුතු සිදු කරන ලදුව පැවති යුධ වාතාවරණය හමුවේ ගොවිතැන් කටයුතු අතහැර ඇත.<br><br>නමුත් වර්තමානයේ යහපත් වාතාවරණයක් පවතින බැවින් සහ වැව ප්‍රතිසංස්කරණය කිරීම සිදු වන බැවින් නැවත වගා කටයුතු සඳහා ඉල්ලීම් කර ඇති බවට ද කරුණු ඉදිරිපත් විය.<br><br>ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ නිලධාරීන්, ග්‍රාම නිලධාරී, වනජීවී | නිවැරදි සහ විශ්වසනීය තොරතුරු මත පදනම් වෙමින් වඩාත් සාධාරණ තීන්දුවක් ගත යුතු බැවින් ප්‍රදේශයේ පාරිසරික වටිනාකම සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු අධ්‍යයනය කර කුඹුරු ගොවිතැන් කටයුතු සඳහා පමණක් අවසරය ලබා දීමට ඇති හැකියාව සොයා බලා සවිස්තරාත්මක වාර්තාවක් ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්-තිස්සමහාරාමය, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, සහකාර අධ්‍යක්ෂ වනජීවී (ඌව) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී මෙම ප්‍රදේශය දැනට කැළෑ ප්‍රදේශයක් ලෙස පවතින බව නිරීක්ෂණය වූ අතර කටගමුව වැව ආසියාවේ වැඩිම කිඹුල් ඝනත්වය සහිත ස්ථානය බවත් අනාවරණය කර ගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.<br>තවද 2010 දී අනවසර හෙළිකිරීම් සම්බන්ධයෙන් පනවන ලද නඩුවක් විභාග වෙමින් පවතින බවට වැඩි දුරටත් දැනුම් දෙන ලදී. | | |
| 4.2 | මැටි කර්මාන්තය සඳහා වීරවිල වැවෙන් නීත්‍යානුකූලව පස් කැපීම සඳහා අවසර ලබා ගැනීම | වැව් සීමාව වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වන බැවින් කර්මාන්තකරුවන් පස් ලබා ගැනීමේ දී එම දෙපාර්තමේන්තුව මගින් නඩු පවරන බවට කරුණු ඉදිරිපත් විය.<br>තවද පස් ඉවත් කර ගැනීම සඳහා අවසරය හිමිවන දින වකවානු ප්‍රමාණවත් නොවන බවද ප්‍රකාශ විය.<br>මැටි කර්මාන්තකරුවන්ට පස් ඉවත් කිරීම සඳහා නීත්‍යානුකූල අවසරය මීට පෙර පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණයක් මගින් ලබා දුන්නද කාලයෙන් කාලයට නිලධාරීන් මාරු වීමේ දී එය නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවන බව ද දැනුම් දෙන ලදී. | මෙය ඉදිරියටද රැක ගත යුතු පාරම්පරික කර්මාන්තයක් වන බැවින් සහ ජාවාරම්කාර ස්වරූපයෙන් පස් ඉවත් කර ගැනීම සිදු නොවන බැවින් කර්මාන්තකරුවන්ට පස් ඉවත් කර ගැනීම සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බවට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්-තිස්සමහාරාම ය<br>සහකාර අධ්‍යක්ෂ වනජීවී (දකුණ) |
| 4.3 | මානජ්ජාව කුඩා වැව සහ වැව් කණ්ඩිය අනවසරයෙන් අල්ලා ගැනීම | මහවැලි සංවර්ධන අධිකාරියට මේ වැව අයත් බවත් ප්‍රදේශවාසීන් කිහිපදෙනෙක් වැව් කණ්ඩිය ද මායිම් වන සේ වැටවල් ඉදිකර නිවාස තනා ඇති බවත් දැනුම් දෙන ලදී. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දෙන ලදී. | නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 4.4 | වලවේ ගඟේ ප්‍රධාන නාන තොටුපලවල් වල පිවිසුම් මාර්ග අවහිර කිරීම සහ එම මාර්ග වලට සණ අපද්‍රව්‍ය හා කැළිකසල දැමීම | ගඟ රක්ෂිතය තුළ අනවසර පදිංචිකරුවන් මේ වන විටත් බරපතල ගැටළුවක් වී ඇති බැවින් නව ඉදිකිරීම් වැළැක්වීමට කටයුතු කළ යුතු බවට සාකච්ඡා විය. | රක්ෂිත සීමාව තුළ නව ඉදිකිරීම් වැළැක්වීමටත් සුරකිමු ගංගා වැඩසටහන යටතේ අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 5.0 | ජලසම්පාදන ක්ෂේත්‍රය | | | |
| 5.1 | අඟුණකොළපැලැස්ස බිංකම ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රමය ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත පවරා දීමට අනුමැතිය ලබා ගැනීම | මෙම ජල යෝජනා ක්‍රමය සමග අලුත්වැව කොටස ද ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදී. | අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ඉංජිනේරු - ජාතික ජල සම්පාදන මණ්ඩලය, ස්ථාන භාර නිලධාරී- ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 5.2 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අදාල සියළුම ආයතන විසින් ලබාදුන් දත්ත අනුව දිස්ත්‍රික්කය සඳහා සකසන ලද සනීපාරක්ෂක සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම | අපජලය ආරක්ෂිතව කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් ලංකාවේ දැනට පවතින තත්ත්වය 11.3%ක්වන අතර එය 2030වන විට 57%ක් දක්වා වැඩි කිරීමත් ගංගා, ඇළ දොළ වැනි ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම තුළින් සුරක්ෂිත පානීය ජලය ජනතාවට ලබා දීම තහවුරු කිරීමත් මෙම සැලැස්ම සකස් කිරීමේ දී අරමුණු වූ බව ප්‍රකාශ කරන ලදී.<br><br>- ස්ථානීය සනීපාරක්ෂක පද්ධති කළමණාකරණය කිරීම සහ වැඩි දියුණු කිරීම මේ යටතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දැනට පවතින සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ සහ නව ඉදිකිරීම් අවශ්‍යතා පිළිබඳ තොරතුරු කඩිනමින් ලබා දෙන්නේ නම් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි බව දැනුම් දෙන ලදී.<br><br>- ප්‍රාදේශීය සභා මගින් දැනට ගලි බවුසර මගින් එකතු කෙරෙන අපද්‍රව්‍ය තැන තැන බැහැර කිරීමේ ක්‍රමවේදය වෙනුවට එක් ස්ථානයකට බැහැර කර පිරිපහදු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. | <br><br>අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී. | <br><br>සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රාදේශීය කළමණාකරු - ජාතික ජල සම්පාදන මණ්ඩලය,<br><br>ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට නාගරික කොමසාරිස්, නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | - ආයතනික මට්ටමින් විමධ්‍යගත අපජල පිරිපහදු මධ්‍යස්ථාන ඉදි කිරීම.<br><br>අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික්කය තුළ පිහිටි රෝහල්, බන්ධනාගාර, පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා අපජල පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රෝහල් අධ්‍යක්ෂවරුන්, රෝහල් අධිකාරීවරුන්, බන්ධනාගාර අධිකාරි, |
| | | හම්බන්තොට නගරය සඳහා මධ්‍යගත අපජල කළමණාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා අවශ්‍ය සියලුම සැලසුම් මේ වන විට සකස් කර ප්‍රතිපාදනද වෙන් කර අවසන් බවත් මේ සඳහා කැලියපුර ප්‍රදේශයෙන් හෙක්ටයාර 20ක ඉඩමක් අවශ්‍ය වී ඇති නමුත් වන අලි කළමණාකරණ ප්‍රදේශයේ පිහිටා ඇති බැවින් යෝජිත ඉඩම ලබා දීම ගැටළු සහගත නම් විකල්ප ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. | යෝජිත ඉඩම යොදා ගැනීම තුළ අලිමංකඩ අවහිර වීම ගැටළුකාරී වන බැවින් ස්ථානීය පරීක්ෂාවකින් පසු විකල්ප ඉඩමක් හඳුනා ගැනිමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට, ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය, සහකාර අධ්‍යක්ෂ වනජීවී (දකුණ) |
| | | 2021-2025 කාලය සඳහා ආයෝජන සැලැස්ම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා රු.මිලියන 12,200ක මුදලක් වෙන් වි ඇති බවත් එම ප්‍රතිපාදන භාවිතා කිරිමට අවස්ථාව නොලැබුනහොත් වෙනත් දිස්ත්‍රික්ක සඳහා යෙදවීමට හැකියාව ඇති බැවින් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සඳහන් කරන ලද තොරතුරු කඩිනමින් ලබා දෙමින් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | | ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 5.3 | ලුණුගම්වෙහෙර ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය ඉඩම් පවරා දීම නියමිත පරිදි සිදු නොවීම. | මේ සඳහා හඳුනාගත් ඉඩම් 07ක් ඇති අතර එම ඉඩම් පවරා දීමට එකඟතාවය පළ කර ඇතත් එම එකඟතාවය ඉදිකිරීම් කටයුතු සඳහා වලංගු නොවන බව සඳහන්ව ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අදාල සියලු තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අවශ්‍ය මැදිහත්වීම් සිදු කළ හැකි බව දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 5.4 | සූරියවැව මහගල්වැව ප්‍රජා ජල ව්‍යාපෘතිය රුහුණුපුර ජල ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ කිරීම | ව්‍යාපෘතියෙහි දෙවන අදියර යටතේ ජල ව්‍යාපෘති සම්බන්ධ කිරිමට හැකියාව ලැබෙන බව සොයා බලන ලෙස දැනුම් දෙන ලදී.<br>ව්‍යාපෘතියෙහි ජලය බීමට නුසුසුදුසු තත්ත්වයේ පවතින බව ව්‍යපෘති පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ බවත් ඒ හේතුවෙන් ප්‍රාදේශීය සභාව මගින් සතියකට දින 02ක් බවුසර මගින් ජලය බෙදා හැරෙන බවත් දැනුම් දෙන ලදී.<br>ව්‍යාපෘතියෙහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර ඇති නමුත් එම මුදල් අවභාවිතා වී ඇති බවට ද අමාත්‍යාංශ මට්ටමේ විගණන පරීක්ෂණයක් සිදු වන බව ද සාකච්ඡා විය. | රුහුණුපුර II අදියර සඳහා ඇතුළත් කිරීමට තීරණය වූ අතර ජල ව්‍යාපෘතිවල මෙහෙයුම් සහ අධීක්ෂණ කටයුතු විධිමත් විය යුතු බව දැනුම් දෙන ලදී.<br>ප්‍රාදේශීය සභාව බවුසර මගින් බෙදා හැරෙන ජලය සඳහා ගාස්තු අය නොකිරීමට තීරණය විය.<br>සිදු කෙරෙමින් පවතින විගණන පරීක්ෂණයෙහි නිරීක්ෂණ ඇතුලත් වාර්තාවක් මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය කළමණාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල දෙපාර්තමේන්තුව |
| 5.5 | නව සම්බන්ධතා ලබා දීම සඳහා නල හා අමතර උපාංග හිඟයක් පැවතීම | නල හා අමතර උපාංග හිඟයක් පැවතීම හේතුවෙන් දිස්ත්‍රික්කය තුළ නව ජල සම්බන්ධතා සඳහා ඉල්ලුම් කරන ලද 500ක පමණ ප්‍රමාණයක ඉල්ලුම සපුරාලීමට නොහැකි වී ඇති බවට කරුණු ඉරිපත් විය. | උපාංග ලබා ගත් විගස අවශ්‍යතා සම්පූර්ණ කර දෙන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමණාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 5.6 | මෙහෙයුම් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා හම්බන්තොට පරිපාලන සංකීර්ණය අසල පිහිටි ඉඩම් කොටසක් වෙන් කර ගැනීම | අදාල ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින බව දැනුම් දෙන ලදී.<br>ජාතික ජලසම්පාදන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, නාගරික සංවර්ධන | ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී.<br>අදාල ආයතන ප්‍රධානීන් සමග සාකච්ඡාවක් ඉදිරි | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශීය කළමණාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන සඳහා කාර්යාල එකම ගොඩනැගිලි සංකීර්ණයක ස්ථාපනය කිරීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. | දිනකදී පැවැත්වීමටත් ඒ අනුව අදාල එකඟතාවයන්ට එළඹීමටත් තීරණය විය. | මණ්ඩලය, නියෝජ්‍ය සමානාධිකාරී - ලංකා විදුලි බල මණ්ඩලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 6.0 | විදුලිබල ක්ෂේත්‍රය | | | |
| 6.1 | සංචාරක කර්මාන්තයට අදාල ව්‍යාපාරික ස්ථාන වල හිඟ බිල්පත් පියවීම වෙනුවෙන් යම් සහන කාල සීමාවක් ලබා දීම | රට තුළ පැවති පාස්කු ඉරිදා ප්‍රහාරය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතු කොට දිස්ත්‍රික්කය පුරා පවතින සංචාරක කර්මාන්තයේ සිදුවූ පසුබෑම හේතුවෙන් මීට අදාල ව්‍යාපාරික ස්ථාන වල විදුලිබල සැපයුම අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සහන කාල සීමාවක් ලබා දිය යුතු බවට සාකච්ඡා විය.<br>සංචාරක මණ්ඩලයේ ලියාපදංචි හෝටල් සංඛ්‍යාව සීමිත වන බැවින් ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි හෝටල් සඳහාද එම සහනය ලබා දෙන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් විය. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සඳහා සමාන මාසික වාරික 12කින් බිල්පත් පියවීමට අවස්ථාව ලබා දී ඇති බව දැනුම් දෙන ලදී.<br>ආදායම් අහිමි හිඟ බිල්පත් ඇති සංචාරක හෝටල් වෙනුවෙන් මෙම වසර අවසානය තෙක් හෝ සහන කාල සීමාවක් ලබා දෙන ලෙසට දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය සමානාධිකාරී - ලංකා විදුලි බල මණ්ඩලය සංචාරක කමිටු සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය |
| 7.0 | ඉඩම් ක්ෂේත්‍රය | | | |
| 7.1 | කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණික පීඨය ස්ථාපනය කිරීම සඳහා නෙටොල්පිටිය දකුණ කොක්වත්ත ඉඩමෙන් අක්කර 12 ක ඉඩම් කොටස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරීමේ ඉදිරි කටයුතු සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ එකඟතාවය ලබා ගැනීම | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවය ලැබී ඇති අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් තරන බව දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තංගල්ල, සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ) |
| 7.2 | කජු සංස්ථාව සඳහා වෙන්කල අක්කර 10 ක භූමිය නැවත ලබා ගැනීම | මෙම භූමිය කජු සංස්ථාව වෙනුවෙන් වෙන් කර තිබූ භූමියක් බවත් එම භූමි කොටස කජු සංස්ථාවේ නව කාර්යාල සංකීර්ණය ඉදි කිරීම සඳහා අවශ්‍ය බවත් දැනුම් දෙන ලදී. | කජු වගාව සඳහා මෙම භූමිය යෝග්‍ය නොවන බැවින් කජු අලෙවි මධ්‍යස්ථානයක්, විවේක ස්ථානයක්, ක්‍රීඩා සංකීර්ණයක්, | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා කළමණාකරු - ශ්‍රී ලංකා කජු සංස්ථාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | | නිවාඩු නිකේතනයක් ඉදි කිරීම ආදී වශයෙන් සියලු අංශ ඒකාබද්ධ කරමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා වූ අතර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ද එකඟතාවය ලබා ගෙන නාගරික සංවර්ධන අධිකාරිය සමග එක්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සුදුසු බවට තීරණය විය. | |
| 7.3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිසි අවසරයක් නැතිව කුඹුරු ඉඩම් ගොඩකර වෙනත් කටයුතු සඳහා යොදා ගෙන ඇති පුද්ගලයන්ගේ නාම ලේඛනයක් ලබා ගැනීම | දිස්ත්‍රික්කය පුරා දැනට මෙවැනි සිද්ධින් 06ක් වාර්තා වී ඇති අතර නඩු පවරා ඇති බව දැනුම් දෙන ලදී. | මෙම සිද්ධීන්ට අදාලව සවිස්තරාත්මත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 7.4 | තංගල්ල නගර සභාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉඩම් කොටසක් ලබා ගැනීම | කාබනික පොහොර නිෂ්පාදනය කිරීමෙන් පසු ඉතිරි වන ඝනඅපද්‍රව්‍ය බැහැර කිරීමට දැනට පවතින ඉඩමේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව දැනුම් දෙන ලදී.<br>නගර සභා සීමාව තුළ යෝග්‍ය ඉඩම් කොටසක් නොමැති බවට සාකච්ඡා විය. | හැකි තරම් කසළ වෙන් කර එකතු කිරීම තුළින් අදායම් ඉපයීමට යොමු වීම වඩාත් උචිත බව තීරණය විය. | ගරු නගරාධිපති - තංගල්ල නගර සභාව |
| 7.5 | සුනඛයන් සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් කොටසක් වෙන් කර ගැනීම | මූල්‍යාධාර ලබා දීම සඳහා පුද්ගලයන් ඉදිරිපත්වී සිටින බව දැනුම් දෙන ලදී.<br>එම පුද්ගලයන් සමග කිසියම් ගිවිසුම්ගත එකඟතාවයකට එළඹීම යෝග්‍ය බවට ද කරුණු ඉදිරිපත් විය. | ව්‍යාපෘති වාර්තාවක් සමග අදාල ඉල්ලීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | අදාල පළාත් පාලන ආයතන නියෝජිතයන් |
| 7.6 | මාර්ග තදබදය අවම කිරීම සඳහා අම්බලන්තොට පොදු වෙළඳ පොළ පොලිසිය ඉදිරිපිට කෘෂිකර්ම දෙපාර්තමේතුවට අයත් භූමියට රැගෙන යාමට | නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට අනුව මෙම ස්ථානය යෝජනා වී ඇතත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලැබී නොමැති බවට කරුණු වාර්තා විය. | අදාල සියලු ආයතනවල සහභාගීත්වයෙන් ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු කරන ලෙස දැනුම් | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය,<br>සහකාර අධ්‍යක්ෂ - අම්බලන්තොට වී |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ඉල්ලීම | අම්බලන්තොට ගොවිපලට අයත් මෙහි දැනට නිල නිවාස පිහිටා ඇති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයට අනුව ද මෙම කොටස ලබා දීමට හැකියාවක් නොමැති බව අනාවරණය වූ බවටද කරුණු ඉදිරිපත් විය. | දෙන ලදී. | පර්යේෂණායතනය |
| 7.7 | ගොන්නොරුව ග්‍රාම නිලධාරී වසමේ සින්නක්කර ඉඩම් වන අලි කළමණාකරණ රක්ෂිතයට ඇතුලත් වන ලෙස ගැසට් කර තිබීම. | මෙම කලාපය වන අලි වැව් වලට බහින ස්ථාන ලෙස හඳුනාගෙන ඒ අනුව මායිම් ලකුණු කරන ලද බවට කරුණු ඉදිරිපත් විය.<br>ගොන්නොරුව පැරණි ගම්මානයක් වන බැවින් ගම්වැසියන්ගේ සින්නක්කර ඉඩම් වන අලි කළමනාකරණ රක්ෂිතයට ගැසට් කිරීම ජනතා විරෝධයකට හේතු විය හැකි බවට සාකච්ඡා විය.<br>වන අලි වෙනුවෙන් ඉතා සීමිත ප්‍රදේශයක් පමණක් මේ වන විට ඉතිරිව පවතින හෙයින් එම කැළෑ ඉඩම් හෙළි පෙහෙළි කිරීම තුළ අලින් ගම් වැදීම වැළැක්විය නොහැකි හෙයින් අනවසර කැළෑ හෙළි කිරීම් නැවැත්වීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | මේ පිළිබඳව සොයා බලා සුදුසු කටයුතු සිදු කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට, සහකාර අධ්‍යක්ෂ වනජීවී (දකුණ) |
| 7.8 | හම්බන්තොට වැලිගත්ත සිතුම්ණිවෙළ විහාරය සඳහා 06/DC/02 පැණිකැගල වැව යටතේ පවතින අනවසර කෙත්බිම් කොටස පවරා ගැනීම | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අක්කර 03ක පමණ ඉඩම් කොටසක් වන මෙය ආරවුලක් හේතුවෙන් දෙපාර්ශවයේම එකඟතාවය මත රජයට පවරා ගැනීමට කටයුතු කරන ලද බව වාර්තා විය.<br><br>සිතුම්ණිවෙල විහාරය සහ ඇතුනදවල විහාරය යන විහාරස්ථාන දෙකම මෙම ඉඩම් කොටස ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙම ඉඩම් කොටස ඇතුනදවල ග්‍රාම නිලධාරී වසමට අයත් බැවින් සහ සිතුම්ණිවෙළ විහාරස්ථානය සම්පූර්ණ ඉඩම් කොටස සඳහා ඉල්ලීම් කරන බැවින් | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේද එකඟතාවය පරිදි විහාරස්ථාන 02 සඳහාම සාධාරණ පදනමකට ඉඩම් කොටස බෙදා දීම සුදුසු බවට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට, ප්‍රාදේශීය ලේකම් - ලුණුගම්වෙහෙර |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡාකර තීරණයක් ගැනීම යෝග්‍ය බවට ප්‍රකාශ විය. | | |
| 7.9 | අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටි ස්ථානයෙන් පොහොර ගබඩාවක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා නොදීම | මෙම වර්ෂය තුල පොහොර ගබඩාවක් ඉදි කිරීම සඳහා මිලියන 03ක ප්‍රතිපාදන වෙන් කර මේ වන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගිවිසුම්ගත වී ඇති බව දැනුම් දෙන ලදී.<br><br>නගර මධ්‍යයේ පොහොර ගබඩාවක් ඉදිකිරීම සඳහා අවසර දිය නොහැකි බවට කරුණු ඉදිරිපත් විය.<br><br>ගොවීන්ට පහසුවෙන් ළඟා විය හැකි වීම නිසා පොහොර ගබඩාව ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ ඉදිකළ යුතු බවද ප්‍රකාශ විය.<br><br>එම ප්‍රදේශයේ ගොවීන්ට අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළින් සේවා සැපයෙන බැවින් එම ආයතනය වෙනත් ස්තානයකට ගෙන යාමේ දී ඒ පිළිබඳවද සැලකිලිමත් විය යුතු බවත් නාගරික සංවර්ධන අධිකාරිය විකල්ප ඉඩමක් යෝජනා කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලිය හැකි බවත් දැනුම් දෙන ලදී.<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩමෙහි කොටසක් පොහොර ගබඩාව ඉදිකිරීම සඳහා යොදා ගැනීමට හැකියාව පවතින බව ප්‍රකාශ විය. | නගර සංවර්ධන කටයුතු වලට බාධාවක් නොවන අයුරින් සියලු ඉදිකිරීම් සිදු කල යුතු බැවින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමාගේ සහ අදාල සියලු ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් කඩිනමින් රැස්වීමක් කැඳවා දීර්ඝ වශයෙන් සාකච්ඡා කර එකඟතාවයන්ට එළඹීමට තීරණය විය. | අධ්‍යක්ෂ - වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br><br>ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් - ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 7.10 | තිස්සමහාරාම පුල්පල්ලම කොඩිගහවැව ගල් වල අයත් ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තු සීමා වලින් නිදහස් කර ගැනීම | 2018 දක්වා මෙම ගල්වල මෙම ස්ථානයේ ක්‍රියාත්මක වී ඇති අතර 2014 වර්ෂයේ රක්ෂිතය ගැසට් කිරීමේ දී රක්ෂිත සීමාවට ඇතුළත්ව ඇති බැවින් නැවත රක්ෂිතයෙන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවට ප්‍රකාශ විය.<br><br>රක්ෂිත සීමාවෙන් නිදහස් කර | දැනටමත් අදාල අනුමැතීන් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් එහි වර්තමාන තත්ත්වය පිළිබඳව සොයා බලා කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, දිසා වන නිලධාරී |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ගැනීම දීර්ඝ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය අවශ්‍ය බවට වාර්තා විය. | | |
| 7.11 | වැලිගත්ත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනය සඳහා අක්කර 250 භූමි ප්‍රමාණයක් ලබාදීම | මෙම යෝජිත අක්කර 250ක භූමිය කඩවර කැළය රක්ෂිතයට අයත් බවට කරුණු ඉදිරිපත් විය.<br>වන අලි කළමණාකරණ රක්ෂිතය තුළ මෙම භූමිය පිහිටා ඇති බැවින් මෙම ඉඩම් ප්‍රමාණය ද අහිමි වීම ගැටළුකාරී වන බවට කරුණු ඉදිරිපත් විය.<br>අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණය මත පදනම්ව අවශ්‍ය අනුමැතීන් සඳහා නිර්දේශ වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බවට වාර්තා විය. | මෙය වැදගත් කාර්යයක් බැවින් එහි වර්තමාන තත්ත්වය පිළිබඳව සොයා බලා කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශිය ලේකම් - තිස්සමහරාමය, ලුණුගම්වෙහෙර/ සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ) / දිසා වන නිලධාරී / වනජීවී සහකාර අධ්‍යක්ෂ |
| 7.12 | රජයේ ඉඩම් කළමණාකරණය පිළිබඳ මායිම් නිශ්චිතව හඳුනා ගැනීමේදී 1981.04.16 දිනැති අංක 137 දරණ ගැසට් නිවේදනය පරිදි ඇතිවූ ගැටළු | මහවැලි අධිකාරියේ වලව බල ප්‍රදේශයේ ව්‍යාපෘති බල ප්‍රදේශය සහ ගැසට් බල ප්‍රදේශය සම්බන්ධ සීමාවන් සම්බන්ධයෙන් ගැටළු ඇති වී ඇති බව දැනුම් දෙන ලදී.<br>මෙම ප්‍රදේශවල ඉඩම් කච්චේරි පැවැත්වීම, නව බලපත්‍ර නිකුත් කිරීම,අනවසර අල්ලා ගැනීම් වැනි කාරණා වලදී නිවැරදි තීරණ ගැනීම සඳහා එම සීමාවන් සම්බන්ධ වෙනස්කම් ඇති වී තිබීම ගැටළුකාරී වන බැවින් කඩිනමින් එම සීමාවන් නිශ්චිත වීම අවශ්‍ය බව දැනුම් දෙන ලදී.<br>තීරණයක් ලබා දෙන ලෙස කිහිප වතාවක් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසීම් කර ඇතත් මේ වන තෙක් පිළිතුරක් නොමැති බවද දැනුම් දෙන ලදී. | පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට යොමු කර සාකච්ඡා කර එකඟතාවයකට එළඹීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට |
| 7.13 | සංචාරක ව්‍යාපෘතියක් සඳහා ඉඩමක් ඉල්ලීම - තිස්සමහරාම, කිරින්ද, | කිරින්ද යාල යුධ හමුදා කඳවුර ආසන්නයෙන් අක්කර 2 රූඩ් 03 පර්චස් 25ක රජයට අයිති | ක්ෂේත්‍ර පරීක්ෂණයෙහි නිර්දේශ ද සහිතව | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාම/ සහකාර අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | පලටුපාන | ඉඩමක් පුද්ගලික හෝටලයක් ඉදි කිරීම සඳහා ඉල්ලීම් කර ඇති බව දැනුම් දෙන ලදී.<br><br>මේ සඳහා අදාල ආයතනික නිර්දේශ සියල්ල ලැබී ඇතත් නියමිත ක්‍රමවේදයට අනුව ප්‍රාදේශිය ඉඩම් පරිහරණ කමිටුව හරහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා යොමු වී නොමැති බැවින් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවට යොමු කර ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා දින නියම කරගෙන ඇති බවද දැනුම් දෙන ලදී. | සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අතර සියලු කරුණු අධ්‍යයනයෙන් අනතුරුව අනුමැතිය ලබා දිමට තීරණය විය. | (ඉඩම් පරිහරණ) |
| 7.14 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු වීරවිල ගොවිපලෙහි පරිහරණය නොකරන ඉඩම් කොටසක් කෘෂිකාර්මික කටයුතු සඳහා ශ්‍රි ලංකා ගුවන් හමුදාවට ඉල්ලීම | අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය එම ඉඩම් කොටස ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති බවත් දැනුම් දෙන ලදී. | අධ්‍යක්ෂ මණ්ඩලය එම ඉඩම් කොටස ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් මෙම කාරණය ඉටු කළ නොහැකි බවට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාම/ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) |
| 7.15 | පළාත් ධීවර අමාත්‍යාංශයේ මත්ස්‍ය ව්‍යාපෘතියක් සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු රිදියගම ගොවිපලෙහි පරිහරණය නොකරන අක්කර 8ක ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ඉල්ලීම. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙම ඉඩම් කොටසෙහි දැනට වගා කටයුතු සිදු නොකරන බැවින් සහ එම ආයතනය සතුව නාමික භුක්තියක් පමණක් මෙම ඉඩම් වෙනුවෙන් පවතින බැවින් මෙම ඉඩම් කොටස ලබා ගැනීම තුළින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය මත්ස්‍ය අවශ්‍යතාවය මුළුමනින්ම පාහේ නිෂ්පාදනය කිරිමට ජලජීවී වගා සංවර්ධන අධිකාරියට හැකියාව ලැබෙන බව දැනුම් දෙන ලදී.<br><br>තවද මෙම අක්කර 08ක ඉඩම් කොටස ලියංගස්තොට අමුණෙහි සිට රිදියගම වැව දක්වා ජලය ගෙනයන ඇළ මාර්ගයට යාබදව පිහිටා | අක්කර 08ක ඉඩම් කොටස ධීවර අමාත්‍යාංශයට පවරා දීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දීමට තීරණය කල අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | ලේකම් - දකුණු පළාත් ධීවර...අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට/ ජල ජීවී වගා ව්‍යාපෘති නිලධාරි - ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තිබීමත් මත්ස්‍ය නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් මේතුළ පිහිටා තිබීමත් යන කරුණු මෙම කටයුතු වඩාත් පහසු කරන බවට ද අදහස් ඉදිරිපත් විය. | | |
| 7.16 | කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩමක් ඉල්ලීම (සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි වගා කටයුතු සහ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු වෙනුවෙන් ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවට වාර්තා විය.<br><br>ජුල්පල්ලම වසමේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද අක්කර 100ක ඉඩම් කොටසක් පවතින බවත් එම මුළු ඉඩම් ප්‍රමාණයම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් භාවිතා නොකරන බැවින් ඉන් කොටසක් ලබා දිමට ප්‍රාදේශිය ඉඩම් පරිහරණ කමිටුවේ දී එම දෙපාර්තමේන්තුව එකඟ වූ බවට ප්‍රකාශ විය. | මෙම කරුණ සම්බන්ධයෙන් තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අතර කරුණු අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාම/ අණදෙන නිලධාරි - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ), |
| 8.0 | **අධ්‍යාපන ක්ෂේත්‍රය** | | | |
| 8.1 | බැරගම ගල්වැව හ/මයුරපුර ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිලි යුධ හමුදා 10 වන ඉංජිනේරු සේවා බලකාය විසින් තාවකාලිකව ලබා ගැනීම නිසා මතුවී ඇති ගැටළු | 2016 වර්ෂයේදී අවශ්‍ය වූ විගස ආපසු ලබා දීමේ පොරොන්දුව මත මෙම ගොඩනැගිලි ශ්‍රී ලංකා යුධ හමුදාව 10 වන ඉංජිනේරු සේවා බලකාය වෙත ලබා දී ඇති බවත් 2017 වර්ෂයේ දී නැවත පාසල ආරම්භ කරන ලද අතර දැනට එම ගොඩනැගිලි අවශ්‍ය වී ඇති බවත් දැනුම් දෙන ලදී.<br><br>නමුත් 2025 වර්ෂය වන තෙක් මෙම ගොඩනැගිලි ලබා දීමට හැකියාවක් නොමැති බවට ඉංජිනේරු සේවා බලකාය විසින් දන්වා ඇති බවද වාර්තා විය. | පාසලේ අවශ්‍යතාවය සලකා බලා අදාල පාසල් ගොඩනැගිලි නැවත පවරා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දීමට තීරණය විය. | අණදෙන නිලධාරි - 10 වන ඉංජිනේරු සේවා බලකාය, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 8.2 | නව පාසල් ආරම්භය | ඔක්තෝබර් 21වන දින වලස්මුල්ල කොට්ඨාසයේ ළමුන් 200ට අඩු පාසල් 24 ක් ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇති බවත් පාසල්වල අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සහ පළාත් පාලන | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සහ දෙමව්පියන්ගේ සහයෝගය ඇතිව අදාල කටයුතු සිදු කර ගන්නා ලෙස | සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - වලස්මුල්ල, හම්බන්තොට, |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ආයතනවල සහයෝගයෙන් සනීපාරක්ෂක කටයුතු සිදු කළ බවත් දැනුම් දෙන ලදී.<br>තවද 2020 වර්ෂයේ අ.පො.ස.සාමානය පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව වලස්මුල්ල අධ්‍යාපන කලාපය දිවයිනෙන් ප්‍රථම ස්ථානය හිමි කර ගත් බවත් ඉංග්‍රීසි විෂය සඳහා 77.41%ක ප්‍රතිශතයක් හිමි කර ගනිමින් දකුණු පළාත් ප්‍රථම ස්ථානය ලබා ගැනීමට සමත් වූ බවත් ඒ සඳහා දායකත්වය දැක්වූ සියලුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කර ගන්නා බවත් දැනුම් දෙන ලදී. | දැනුම් දෙන ලදී. | තංගල්ල |
| 8.3 | පාසල්වල අනධ්‍යයන කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම | ඔක්තෝබර් 21වන දින හම්බන්තොට කලාපයේ පාසල් 44ක් ආරම්භ කිරීමට නියමිත බවත් පාසල් සඳහා අනධ්‍යයන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවත් දැනුම් දෙන ලදී.<br>එබැවින් බහුකාර්ය සංවර්ධන බලකායේ නිලධාරීන් ලබා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. | අවශ්‍යතා ලේඛනය කඩිනමින් ඉදිරිපත් කළ පසු එම ඉල්ලීම ඉටු කිරීමට තීරණය විය.<br>අනෙක් කලාප කාර්යාල සඳහා ද අවශ්‍යතාවයක් පවතී නම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | අදාල ප්‍රාදේශීය ලේකම්වරු<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට, වලස්මුල්ල, තංගල්ල |
| 9.0 | **සෞඛ්‍ය ක්ෂේත්‍රය** | | | |
| 9.1 | හම්බන්තොට පැරණි රෝහල් පරිශ්‍රය විශේෂිත ප්‍රතිකාර රෝහලක් ලෙස වැඩිදියුණු කිරීම | ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන බෝවන රෝග ඒකකය දැනට තාක්ෂණික ඇගයීම් කමිටු මට්ටමේ පවතින බවත් එම කටයුතු අවසන් වූ විගස ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිත බව දැනුම් දෙන ලදී.<br>මෙම රෝහල වෙනම රෝහලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | කටයුතු කඩිනම් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කිරීමට තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට,<br>රෝහල් අධ්‍යක්ෂ - මහ රෝහල හම්බන්තොට |
| 9.2 | අම්බලන්තොට නගරය සඳහා සහ හම්බන්තොට රෝහල සඳහා ඔසුසැල් 2ක් ලබා දෙන ලෙස ඉල්ලීම. | මෙම ස්ථානයන්හි ඔසුසැලක් නොමැතිවීම තුල ප්‍රදේශවාසීන් බලවත් අපහසුතාවයන් මුහුණ දී ඇති බව දැනුම් දෙන ලදී. | අම්බලන්තොට නගරය සඳහා ඔසුසැලක් ඉදිකිරිමට ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.<br>හම්බන්තොට | සභාපති - ප්‍රාදේශීය සභාව, අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | රෝහල සඳහා ඔසුසැලක් යෝජිත රෝහල් චතුරශ්‍රයට ඇතුලත් වන බැවින් පුද්ගලික ෆාමසියක් සඳහා යෝජිත වෙලඳ සංකීර්ණය තුල කඩිනමින් ඉඩකඩ වෙන් කිරීමටත් තීරණය විය. | පුරපති - හම්බන්තොට මහ නගර සභාව |
| 10.0 | වෙනත් ගැටළු | | | |
| 10.1 | 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වලට අනුමැතිය ලබා ගැනීම | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු එකඟතාවය මත ප්‍රතිලාභීන් සංඛ්‍යාව පදනම් කර ගනිමින් 2022 වර්ෂය සඳහා සකස් කරන ලද යෝජනා 23ක ලයිස්තුවක් ඉදිරිපත් කරන ලද බව ප්‍රකාශ විය.<br>මාවැල්ල කලපුව සංවර්ධනය කිරිම ද යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙද දැනුම් දෙන ලදී. | එම යෝජනා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය ලබා දීමට තීරණය විය. | සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් අපදා කළමනාකරණ ඒකකය |
| 10.2 | අක්‍රිය ගැමිදිරිය සමාගම් වලට අයත් ගොඩනැගිලි, ග්‍රාමීය මට්ටමේ සේවාවන් සැපයීම සඳහා පොදු ස්ථාන ලෙස යොදා ගැනීමට ජීවනෝපාය සංවර්ධන අනු කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | එවැනි අක්‍රිය සමාගම් 9ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින බැවින් එම ගොඩනැගිලි පවරා ගෙන වසම්භාර නිලධාරීන්ගේ කාර්යාල පවත්වා ගෙන යාම සඳහා යොදා ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | ප්‍රයෝජනයට නොගන්නා එම ගොඩනැගිලි අදාල පාර්ශවයන්ගේ එකඟතාවය ඇතිව පොදු කටයුතු සඳහා භාවිතයට කමිටුවේ එකඟතාවය ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - බෙලිඅත්ත |
| 10.3 | බඳගිරිය වසමේ පිහිටි සුළු ධීවර සම්මේලන ගොඩනැගිල්ල පවරා ගැනීම | 1996 වර්ෂයේ පමණ සිට ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධානයක් බවත් දැනට මෙය ක්‍රියාත්මක නොවන බවත් දැනුම් දෙන ලදී.<br>මෙය ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමක ඉදිකර ඇති බැවින් ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස එම සංවිධානයේ සභාපති වෙත දැනුම් දී ඇති බවට කරුණු වාර්තා විය. | මෙම ගොඩනැගිල්ල කඩිනමින් පවරාගෙන ප්‍රයෝජනවත් කාර්යයක යෙදවීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| 10.4 | ළමා හා කාන්තා විෂය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම | විෂයභාර අමාත්‍යතුමා විසින් ද ඉල්ලීම් කර ඇති බැවින් මේ වන විටත් රැස්වීමට සම්බන්ධ වී සිටියද ආරාධනා ලද බව | අදාල ඉල්ලීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | එතුමාව දැනුවත් කරන ලෙස දැනුම් දෙන ලදී.<br>ළමා හා කාන්තා විෂයට අදාල ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සම්බන්ධ කර ගන්නා ලෙසට ඉල්ලීම් කරන ලදී. | | |
| 10.5 | නව පොලිස් ස්ථාන ආරම්භ කිරීම | වරාපිටිය පොලිස් ස්ථානය සඳහා සුදුසු ඉඩමක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. යෝජිත ඉඩම නගරයට මදක් ඈතින් පිහිටා තිබීම ගැටළුවක් බව ද දැනුම් දෙන ලදී. | අදාල ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - වලස්මුල්ල, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි- තංගල්ල |
| 10.6 | බටඅත උතුර වසා දමා ඇති පාසල් ගොඩනැගිල්ල එම වසමේ සේවා පියස සඳහා ඉල්ලීම | බාලදක්ෂ ව්‍යාපාරය සඳහා මෙම ගොඩනැගිල්ල ලබා දී ඇති අතර එහිදී වෙනත් කාර්යයක් සඳහා යොදා ගන්නේ නම් අමාත්‍යාංශ අනුමැතිය ලබා ගත යුතු බවට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති බව වාර්තා විය. | හම්බන්තොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ විරුද්ධත්වයක් නොමැති බැවින් අමාත්‍යාංශය දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 10.7 | එරමිණියාය INSEE සිමෙන්ති ගබඩාව මගින් ප්‍රදේශවාසීන්ට ඇතිවී තිබෙන ගැටළු | දැනුවත් කළ යුතු සියළු අංශ දැනුවත් කර ඇති බවට ප්‍රකාශ විය.<br>මධ්‍යම පරිසර අධිකාරිය මගින් පරික්ෂා කිරීමෙන් අනතුරුව අදාල නිර්දේශ ලිඛිතව අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව වෙත ලබා දි ඇති බව දැනුම් දෙන ලදී. | මේ පිලිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කරන ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලදී. | සභාපති - අඟුණකොලපැලැස්ස ප්‍රදේශීය සභාව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 10.8 | ආලෝකපුර ප්‍රදේශයෙන්, වරායට පවරා ගැනීමට යෝජිත ඉඩම් වල සිදුවන අපචාර ක්‍රියා | ජනාවාසවලින් තොරව වල් බිහි වී දැනට ඉතිරිව පවතින අබලන් ගොඩනැගිලිවල සුන්බුන් නිසා විවිධ අපචාර ක්‍රියා සිදුවෙමින් පැවතීම ගැටළුවක් බවට වාර්තා වී ඇත. | වරායට පවරා ගැනීමට යෝජිත වී ඇති බැවින් එම ඉඩම් එළපෙහෙලි කර ගැනීම වරාය අධිකාරිය සතු වගකීමක් බව දැනුම් දීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට, කළමනාකරු - මාගම් රුහුණුපුර ජාත්‍යන්තර වරාය, සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |

මහජන ශුභසිද්ධිය පිණිස කටයුතු කිරීම දේශපාලන අධිකාරියේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම වන බැවින් දෙපාර්ශවයම න්‍යායශීලීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලද අතර මෙම රැස්වීමේ දී ගනු ලැබූ තීරණ සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස ද දන්වමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තූතිය පලකරමින් ප.ව 2.00ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය
2021ඔක්තෝබර් මස ....25.... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.